

# වර්තමානයේ ප්‍රවීණ සංගීතවේදීන් බිහි නොවන්නේ ඇයි?

සංගීතය පිළිබඳ සාකච්ඡා කරන විට මහා සම්ප්‍රදායවල් දෙකක් පිළිබඳ කතිකා කල යුතු වේ. අපරදිග රටවල පවත්නා අපරදිග සංගීතයන්ද පෙරදිග රටවල පවත්නා පෙරදිග සංගීතයන්ද දෙයාකාර වේ. මේ අතර චූල සම්ප්‍රදායයන් බොහෝ ඇතත් එයින් සුළු වශයෙන් කීපයක් අපි නම් කරමු. පෙරදිග රබීන්ද්‍ර සංගීතය ගුජරාට, මරාට සංගීතයද බටයාලි යන සංගීත ක්‍රමද බෙහෙවින් ජනප්‍රිය වී ඇත. කෙසේ වෙතත් මෙයින් වඩාත් දියුණු වී ඇත්තේ හින්දුස්ථානි ශාස්ත්‍රීය සංගීතය බව පිළිගනිමු. මෙම ශාස්ත්‍රීය සංගීතය ද වෙන වෙනස් සම්ප්‍රදායයන් ඇත.

1.. භාත්ඛණ්ඩේ පඬිතුමාගේ ශාස්ත්‍රීය පද්ධතිය
2. ඕම්කාර්නාත් ඨාකූර්යයන්ගේ පද්ධතිය
3. රාමශ්‍ර ජා මැතිතුමාගේ පද්ධතිය

මේ සංගීත ක්‍රම ඒ ඒ පළාත්වලට ආවේණික වූ සංගීත ක්‍රම බව කිව හැක. විශේෂයෙන් රබීන්ද්‍ර සංගීතය යනු මහා කවි රවීන්ද්‍රනාත් ඨාකූර්යයන් විසින් නිර්මාණය කරන ලද විශේෂ ගී ශෛලියකි. මෙහි මහා සම්ප්‍රදාය මෙන් රාග, තාඨ, තාල යනුවෙන් ප්‍රබල නීති රීති නැත. එමෙන්ම අනෙකුත් සම්ප්‍රදායන් ඒ ඒ පැතිවලට ආවේණික වූ ක්‍රමයන්ගෙන් පරිපූර්ණ වේ. ශාස්ත්‍රීය සංගීතය හැදෑරීමේ දී හින්දුස්ථානි සංගීතය ප්‍රථමයෙන් අධ්‍යයනය කළ යුතු බව විද්වතුන්ගේ මතයයි. මීළඟට භාරතයේ ඇති ප්‍රවීණ ගුරුකුළ පිළිබඳ කෙටි අධ්‍යයනයක් කරමු. ලෝක ප්‍රකට පණ්ඩිත් රවි ශංකර් බිහි වන්නේ " මයිහාර් ගරානා වලට" බව පිළිගත් සත්‍යයකි. මෙම ගරානාව තුළ වර්ෂ 10 - 15 නොකඩවා උස්තාප් අලහුඩීන් ඛාන් නැමැති මහා සංගීත වේදියා යටතේ සියලුම සිසු සිසුවියන් ඉගෙන ගත යුතුවේ. එම ආශ්‍රමය තුළ පැය 10ක් අවම වශයෙන් නොකඩවා පුහුණු වීම්කළ යුතු වේ. ඒ අතර ගුරුතුමා පැමිණ ඔවුනට ගුරුහරුකම් දී වෙනත් සිසුවකු ළඟට යෑම ඔහුගේ පුරුද්දක් විය. මෙය බෞද්ධාගම ප්‍රකට කිරීම සඳහා ගෞතම බුදුන් දේශනා කළ පිරිත්, බණ සහ ගාථා මෙන්ම අලහුඩීන් ඛාන් ද ඒ ඒ සිසුවන් වෙත තමා ඉගෙන ගත් රාග, තාල පිළිබඳ විස්තරයක් දෙයි. අවු 10 සම්පූර්ණ වූවාට පසු එම ශිෂ්‍යයා ශිල්පියකු බවට අනිවාර්යයෙන් පරිවර්තනය වේ. මෙහිදී ගණිතය ඉතිහාසය භූගෝලය වැනි විෂයයන් ඉගැන්වීම නොකෙරේ. උගන්වනනේ ශෘස්ත්‍රීය සංගීතය පමණි.

භාරතයේ බිහි වූ බොහෝ සංගීතවේදීන් අතුරින්

- ★ පණ්ඩිත් රවි ශංකර්
- ★ අලි අබ්බර් ඛාන්
- ★ අණ්ණ පූර්ණා දේවි
- ★ පන්නලාල් ඝෝස්
- ★ ඔස්තාර් බිසිමිල්ලා ඛාන්

වැනි ශ්‍රේෂ්ඨ සංගීත වේදීන් මෙම ගුරුකුලයෙන් බිහි වී ඇත. අපි අනිත් ගරානා පිළිබඳ විස්තර කිරීමට ප්‍රථම මෙහි සිදු වූ යම් යම් දේ පිළිබඳ නිර්ණය කළ යුතු බව හැඟේ. පැය 24ක් තුළදී කෑම බීම පිළිබඳව තමාම ක්‍රියා කළ යුතු වේ. නගරයට යෑම ගමට යෑම වැනි දෑ ඔවුන්ගෙන් කෙරුනේම නැත. එතැනින් බිහිවන්නේ සර්ව සම්පූර්ණ සංගීතවේදීන් බව කවුරුත් පිළිගත් මතයකි. මෙයින් පිට වූ පසු ජීවත් වීම පිළිබඳ ගුරුතුමා කිසි ලෙසත් උපකාර නොවනු ඇත. ඔහුගේ උපකාරය සංගීතය ඉගැන්වීම පමණි. මෙහිදී ප්‍රධාන කරුණ කිසිම ගාස්තුවක් තෑග්ගක් කිසියම් හෝ දෙයක් ගුරුතුමා භාර නොගැනීමයි. ඉහත නම් සඳහන් සෑම දෙනාමත් තවත් නම් සඳහන් සෑම දෙනාමත් ලෝක පූජිතවරු බව අප දන්නා කරුණකි.

පණ්ඩිත් රවි ශංකර් උපතින්ම බෙංගාලි ජාතිකයෙක් වේ. ශාස්ත්‍රෝත්ග්‍රහනයෙන් පසු ඔහු කල්කටාවේ ඔහුගේ ගමට සම්ප්‍රාප්ත වී මාසයක් පමණ සිතාරය තමන් රිසි සේ පුරුදු පුහුණු වී සිටි බව කවුරුත් පිළිගන්නා සත්‍යයකි. නමුත් ඔහුට අවු 10 - 15 තිස්සේ ගුරුතුමාගෙන් උගන ගත් දෙයින් කිසිදු ආදායමක් නොලැබූ බව ඔහු මෙනෙහි කරමින් සිටි බව කියති. වරක් ජීවත් වීම ගැන කලකිරුණු මෙතුමා සියදිවි හානි කර ගැනීම උචිත යැයි සිතූ ඔහු ගංගා නම් ගඟට පැන සිය දිවි හානි කර ගැනීම සඳහා ගංතෙරේ ඇවිදමින් සිටි බව පොත පතේ සඳහන් වේ. මෙවිටම යම් අදෘශ්‍යමාන බලවේගයකින් එක් සෘෂිවරයෙක් ඔහු ඉදිරියේ පෙනී සිට ණීපුතා ඔබ ගඟට පනින්නද යන්නේ. ඇයි ඔබට මහානුභාව සංගීත පිහිටීමක් ඇත. තව සතියකින් එය එළිදැක්වීමට අවස්ථාව ලැබෙනු ඇත. හොඳ පුතා වගේ නැවත ගෙදර ගොස් පුහුණු වීම්වල යෙදෙන්න□ ඒ එසේ කීවාක් මෙන් කුඩා දරුවකු පරිදි ඔහු අවනත වී ගෙදර ගොස් පුහුණු වීම් කටයුතු වල යෙදුණු බව කියති. හරියටම සංගීත පීඨයකින් සංදර්ශනයක් පැවැත්වීමට ඔහුට ආරාධනය කරන ලදි. එදා පටන් මිය යන තුරුම සංගීත සංදර්ශන එතෙර මෙතෙර සිය දහස් වරක් සංදර්ශන පැවැත්වීමට ඔහුට සිදු විය. මෙය පණ්ඩිත් රවිශංකර්ගේ ණීඑශ බෂතෑ 'හෘ එශ එඕෂක□ යන ග්‍රන්ථයෙන් පැහැදිලිව විස්තර කර ඇත.

එමෙන්ම අනෙක් සංගීතවේදීන්ටද මෙවැනි අත්දැකීම් සිදු වූ බව ද සඳහන් වේ.

ශාස්ත්‍රීය සංගීතය ප්‍රගුණ කිරීමේ දී ඉතා සංයමයකින් ඕනෑ කමකින් පරිශ්‍රමයකින් කළ යුතු බව මෙයින් ඔප්පු වේ. එකල රැකියාව පිළිබඳ කිසිදු අපේක්ෂාවක් නොමැතිව සංගීතය ඉගෙන ගැනීමත් ඔවුන්ගේ කාර්යයයි. මෙම සිසුවන්ගේ කාලය වර්ෂ 10 පමණ දවසට පැය 10 බැගින් පුහුණු කටයුතු කළ යුතු බව සඳහන් වේ. නමුත් වර්තමාන සිසුවන් සතියට පැයක් පමණ පුහුණු වී සංගීතවේදීන් වීමට තැනීම "අහසේ මාළිගා තැනීමක්" වැනිය මෙවැනි විශාල ඉගැන්වීමේ ක්‍රම විශ්ව විද්‍යාල, විද්‍යායතන වෙනත් ආයතන බිහිවූවාට පසු වසර 4/5 පමණ සීමා විය. එම නිසා වසර 10කින් පමණ ඉගැන්වූ ඒ ශ්‍රේෂ්ඨ සංගීතය වසර 5කින් විශ්ව විද්‍යාලතුළින් එළි දැක්වීම විහිළුවට කරුණක් ද? සිහිනයට කරුණක් ද? ප්‍රශ්නයකි ...? මෙය කාලීන ප්‍රශ්නයට විසඳුමක් බව ප්‍රභූවරුන් විසින් ප්‍රකාශ කර ඇත. එහෙත් වර්තමානයෙත් මෙවැනි ගුරුකුළ තවත් තිබෙන බව පසුව ලියන ලිපිවල ඇතුළත් කරන බව සඳහන් කරමි.

මේ අනුව බලන විට ගීතයක් ගැයීම වාදනයක් ඉදිරිපත් කිරීමෙන් සංගීතවේදියකු වීමට කොහෙත්ම බැරි බව අප වටහා ගත යුතු වේ. සංගීතය පිළිබඳ



සංගීත ශාස්ත්‍රපති,
අනිල් මිහිරිපැන්න

අත්දැකීම් ඇති එම විෂය පිළිබඳ විපුල දැනුමක් ඇති ගුරුතුමකුගෙන් ඉගෙන ගත යුතු බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරමි. එසේ නොමැතිව යම් සරල ශාස්ත්‍රීය ගීතයක් ගැයූ පමණින් සංගීතවේදියෙක් වීම උගහටය. නියම අවබෝධයකින් අපේක්ෂාවකින් සංගීතය ඉගෙන ගතයුතු බව අමුතුවෙන් කිව යුතු නොවේ.

